# බෞද්ධ මූලාශ්‍රයවල පැනෙන අනෝතත්ත විල සහ අනුරාධපුර විජයාරාමයෙන් හඳුනාගත් දිශා සංකේත පිහිලි ආවරණ සත්ත්ව රූප පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

එච්. ඒ. එන්. යූ. ජයරත්න[1], ගාල්ලේ ධම්මින්ද හිමි[2], පාහියංගල සුමංගල හිමි[3]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පෞරාණික වාස්තුවිද්‍යාව සහ සිතුවම් මෙන්ම කැටයම් කලාවන් අධ්‍යයනය කිරීමේ දී ත්‍රිපිටක සාහිත්‍යය මූලාශ්‍රය සහ භෞතික පුරාවිද්‍යාත්මක සාධක අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාව ඉතා වැදගත් ශාස්ත්‍රීය මානයකි. බෞද්ධ විශ්වවිද්‍යාත්මක සංකල්ප මෙරට පූජනීය හා ආරාමික ගොඩනැගිලි නිර්මාණකරණයේ දී සෘජුවම බලපා ඇති ආකාරය පිළිබඳ විවිධ විද්වතුන් විසින් මත පළ කර ඇත. බෞද්ධ සාහිත්‍යයේ පැනෙන හිමාල වර්ණනාවන් අතර සුවිශේෂී ස්ථානයක් ගන්නා අනෝතත්ත විල සහ එම විලෙන් සිව් දිශාවට ගලා යන සිව්මහා ගංගාවන් පිළිබඳ සංකල්පය මෙරට වාස්තු විද්‍යාත්මක මූලධර්ම හැඩගැසීමට බෙහෙවින් ඉවහල් වී තිබේ.

අනුරාධපුරයේ පිහිටි සුවිශේෂී පබ්බත විහාර සම්ප්‍රදායේ ආරාම සංකීර්ණයක් වන විජයාරාමය, මෙම බෞද්ධ සංකේතවාදය ප්‍රායෝගිකව උපයෝගී කරගත් ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. මෙරට ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ එච්. සී. පී. බෙල් විසින් 1891-1893 වර්ෂවල විජයාරාමයේ සිදුකළ කැණීම්වල දී ද්වාර මණ්ඩප ආශ්‍රිතව ලෝකඩ සත්ත්ව රූප හතරක් සොයාගත් අතර ඔහු විසින් ඒ ආශ්‍රයෙන් දිශානුගත සත්ත්ව සංකේතවාදයක් (Cardinal Direction Symbolism) අර්ථකථනය කරන ලදි. එහෙත් එම අර්ථකථනය දීර්ඝ කාලයක් තිස්සේ සාක්ෂ්‍ය හිඟකම හේතුවෙන් විවිධ විචාරයන්ට ලක් විය. මෑතක දී, එනම් 2015 වර්ෂයෙන් පසුව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් විජයාරාමය පරිශ්‍රයේ සිදු කරන ලද කැණීම් මගින් දොරටු මණ්ඩප දෙපස පනා බැම්වල (wing-walls) වැසි ජලය බැස යාමට නිර්මාණය කර තිබූ ජල පිහිලි, පිහිලි ආවරණ සහ ඒවායේ කැටයම් කර තිබූ සත්ත්ව රූප අනාවරණය කර ගැනීමට හැකි විය. මෙම පර්යේෂණය මගින් බෞද්ධ මූලාශ්‍රයවල පැනෙන අනෝතත්ත විල පිළිබඳ සංකල්පයීය තොරතුරු සහ විජයාරාමයෙන් හමු වූ මෙම නව පුරාවිද්‍යාත්මක සාධක සංසන්දනය කරමින් දිශා සංකේතවාදයේ වලංගුභාවය සහ එහි ඇති දෘශ්‍ය කලාත්මක භාවිතය විමසා බලනු ලැබේ.

## පර්යේෂණ ගැටලුව සහ අරමුණ

බෙල් විසින් විජයාරාමයෙන් ලෝකඩ සත්ත්ව රූප සොයාගෙන ඉදිරිපත් කරන ලද දිශා අර්ථකථනය සඳහා එම පරිශ්‍රයෙන් ම අතිරේක ව්‍යුහාත්මක හෝ වාස්තු විද්‍යාත්මක සාධක මෑතක් වන තුරු ම ලැබී නොතිබීම ප්‍රධාන පර්යේෂණ ඌනතාවක්

1 ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යා නිලධාරී, මධ්‍යම සංස්කෘතික අරමුදල. nilankaarch@bpu.ac.lk
2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. galledhamminda@busl.ac.lk
3 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. sumangalap@busl.ac.lk

විය. එමෙන්ම බෞද්ධ මූලාශ්‍රයවල විස්තර වන අනෝතත්ත විලේ සිව්මහා මුඛවලින් පිටවන සත්ත්ව සංකේත සහ ශ්‍රී ලංකාවේ ආරාමික වාස්තුවිද්‍යාවේ ජල කළමනාකරණය පද්ධති (Water Management Systems) අතර පවතින මාතවාදී සබඳතාව තවදුරටත් තහවුරු කිරීමේ අවශ්‍යතාවක් පැවතිණි. එබැවින් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ 2015 වර්ෂයෙන් පසු විජයාරාමයෙන් හමු වූ නව ජල පිහිලි ආවරණ සත්ත්ව රූප සාධක පදනම් කරගනිමින් බෙල් විසින් ඉදිරිපත් කළ දිශා සංකේතවාදී ප්‍රකාශනයේ ශාස්ත්‍රීය වලංගුභාවය නැවත විමසා බැලීම සහ බෞද්ධ සාහිත්‍යගත අනෝතත්ත විලේ සංකල්පය මෙරට වාස්තු විද්‍යාව තුළ ප්‍රතිනිර්මාණය වී ඇති ආකාරය විශ්ලේෂණය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qualitative Approach) සහ සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රමය (Comparative Analysis) උපයෝගී කරගන්නා ලදි. දත්ත රැස්කිරීමේ දී මූලාශ්‍රය වර්ගීකරණය ප්‍රධාන කොටස් දෙකක් යටතේ සිදු විය.

සාහිත්‍යය මූලාශ්‍ර (Literary Sources) - පාලි ත්‍රිපිටකය, අංගුත්තර නිකාය අටුවාව (මනෝරථපූරණී), සුත්තනිපාත අටුවාව, ජාතක අටුවාව (කුණාල ජාතකය), අපදානපාළි, පූජාවලිය සහ බුත්සරණ වැනි සිංහල සම්භාව්‍ය මූලාශ්‍රය මෙන්ම ලංකාවතාර සහ සද්ධර්මපුණ්ඩරීක වැනි මහායාන සූත්‍ර ද, චීන ජාතික හියුං සියෑං හිමිනමගේ දේශාටන වාර්තා ද පරිශීලනය කරන ලදි.

පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය (Archaeological Sources) එච්. සී. පී. බෙල්ගේ මුල් කැණීම් වාර්තා (1891-1893) සහ 2015 වර්ෂයෙන් පසු මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් විජයාරාමයේ සිදුකළ නවතම කැණීම් මගින් පාදාගත් පනා බැම් සහ ජල පිහිලි ආවරණවල භෞතික සාධක සෘජුවම නිරීක්ෂණය කරමින් දත්ත ලබා ගන්නා ලදි. තවද, මෙම සාධක අනුරාධපුරයේ සෙසු ස්මාරක වන රත්නප්‍රාසාදය, මිහින්තලේ කණ්ඨක චෛතිය සහ පංකුලිය අශෝකාරාමය වැනි ස්ථානවලින් හමුවන සත්ත්ව රූප සාධක සමඟ සංසන්දනය කරමින් විශ්ලේෂණය කරන ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**බෞද්ධ මූලාශ්‍රයවල පැනෙන අනෝතත්ත විල පිළිබඳ සංකල්පය**

ත්‍රිපිටක සාහිත්‍යයට අනුව අනෝතත්ත විල යනු හුදෙක් භෞතික විලක් පමණක් නොව, එය පවිත්‍රත්වයේ, ප්‍රඥාවේ සහ ඍද්ධි ප්‍රාතිහාර්යයන්ගේ සංකේතයකි. ''අනෝතත්ත'' යන්නෙහි කෝෂී අර්ථය ''කිසිදා රත් නොවන'' හෝ ''සූර්ය තාපයෙන් පීඩා නොවිඳින'' යන්නයි. හිමාල පර්වත වැටියෙහි කෛලාශ ආශ්‍රිතව පිහිටා ඇති මෙම විල, සූර්යයා සහ චන්ද්‍රයා උදාවන සහ බැසයන අවස්ථාවන්හි දී අවට ඇති මහා පර්වත (සුදර්ශන, චිත්‍ර, කාළ, ගන්ධමාදන, කෛලාශ) මගින් ආවරණය වන බැවින් සෘජු සූර්යාලෝකය මීට පතිත නොවේ. හිමාලයේ ඇති මහා විල් හත අතුරින් ප්‍රධානතම විල වන මෙය යොදුන් 150ක ප්‍රමාණයෙන් යුක්ත වන අතර, එහි ජලය අතිශයින්ම පිරිසිදු,

සිසිල් සහ සුවඳවත්ය. කිසිදු පාසි වර්ගයක්, මඩක් හෝ කැස්බෑවන් වැනි සතුන් මෙහි වාසය නොකරන බව මූලාශ්‍රය පවසයි. චීන දේශාටක හියුං සියැං හිමිගේ වාර්තාවලට අනුව මෙම විල ලෝකයේ මධ්‍යය ලෙස සලකා ඇත.

මූලාශ්‍රයවල සඳහන් පරිදි, මනා සෘජුකෝණාස්‍ර හැඩයකින් යුත් මෙම අනෝතත්ත විලේ සතර දිශාවෙහි සතර මුඛයන් පිහිටා ඇති අතර, ඒවායින් ප්‍රධාන ගංගාවන් හතරක් ආරම්භ වේ.

නැගෙනහිර දිශාවේ සිංහ මුඛයෙන් සිංහ ගංගාව (ඉන්දු නදිය) ගලා යයි.

දකුණු දිශාවේ වෘෂභ (ගව) මුඛයෙන් වෘෂභ ගංගාව (ඔක්සස් නදිය) ගලා යයි.

බටහිර දිශාවේ අශ්ව මුඛයෙන් අශ්ව ගංගාව (සිතා/යැංසි නදිය) ගලා යයි.

දකුණු/නැගෙනහිර වෙනත් මූලාශ්‍රය ගත බෙදීම් අනුව හස්ති මුඛයෙන් හස්ති ගංගාව (ගංගා නදිය) ගලා බසී.

මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්නගේ පර්යේෂණවලට අනුව රන්ගිරි දඹුල්ල රජමහ විහාරයේ (3 වන ගුහාව) මෙම අනෝතත්ත විලේ සතර දිශා මුඛයන් සහ ගංගා හතරක් ලෙස බෙදී ගලායන ආකාරය ඉතා පැහැදිලිව සාම්ප්‍රදායික සිතුවමට නගා ඇත. බුත්සරණ, පූජාවලිය වැනි ග්‍රන්ථයන්හි සුමන සාමණේරයන් සහ පන්නක නා රජු අතර අනෝතත්ත විලේ පැන් රැගෙන යාම පිළිබඳව සිදු වූ පුවත ද්විතීයික වශයෙන් මෙම විලේ ඇති පූජනීය හා සෘද්ධිමය වටිනාකම මැනවින් විදහා දක්වයි.

**අනුරාධපුර විජයාරාමයේ නව පුරාවිද්‍යාත්මක සොයාගැනීම්**

අනුරාධපුර විජයාරාමය යනු මධ්‍යයේ චතුරශ්‍රාකාර මළුවක් මත ස්තූපය, බෝධිඝරය, පටිමාඝරය සහ උපෝසථඝරය යන අංග සතරකින් සමන්විත වූ පබ්බත විහාරයකි. එච්. සී. පී. බෙල් මුල්කාලීනව සොයාගත් ලෝකඩ සත්ත්ව රූප සතර පදනම් කරගෙන නැගෙනහිරින් ඇතා ද, දකුණින් අශ්වයා ද, බටහිරින් ගවයා ද, උතුරින් සිංහයා ද වශයෙන් දිශාවන් නිරූපණය වන බව ප්‍රකාශ කළ ද, මෑතක් වන තුරුම විජයාරාමයෙන් ඊට අදාළ වෙනත් ව්‍යුහාත්මක සාක්ෂ්‍ය ලැබී නොතිබුණි.

එහෙත් 2015 වර්ෂයෙන් පසුව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සිදුකළ නව කැණීම්වල දී ද්වාර මණ්ඩප දෙපස පිහිටි පනා බැම් (wing-walls) පාදාගත් අතර එහිදී වැසි ජලය බැස යාම සඳහා නිර්මාණය කර තිබූ ජල පිහිලි (water spouts) 08ක් (සතර දිශාවට පිහිලි 02 බැගින්) හඳුනාගැනීමට හැකි විය. මෙම ජල පිහිලි වැසීම සඳහා යොදාගෙන තිබූ ආවරණ (spout covers) සත්ත්ව රූපවලින් කැටයම් කර තිබීම සුවිශේෂී සාධකයකි. නව කැණීම් දත්තයන්ට අනුව එම සත්ත්ව රූපවල දිශාගත පිහිටීම පහත පරිදි වේ.

නැගෙනහිර දිශාවට ඇත් රූප 02 ක් හමුවී ඇති අතර, මෙය සෙසු ක්ෂේත්‍ර සාධක වන රත්නප්‍රාසාද මුරගල සහ අශෝකාරාම පිළිමගේ නැගෙනහිර මුරගල සමඟ සැසඳේ.

දකුණු දිශාවට අශ්ව රූප 02 ක් හමුවී ඇත.

බටහිර දිශාවට ගව රූප 02 ක් හමුවී ඇති අතර, මෙය මිහින්තලේ කණ්ඨක චෛතිය වාහල්කඩ සහ අශෝකාරාම පිළිමගේ බටහිර මුරගල සමඟ සැසඳේ.

උතුරු දිශාවට මෙතෙක් තහවුරු කර නොමැත (එක් පිහිලි ආවරණයක් පළුදු වී ඇත).

දැනට ලැබී ඇති නැගෙනහිරින් ඇත් රූප ද, දකුණෙන් අශ්ව රූප ද, බටහිරින් ගව රූප ද යන භෞතික සාධක බෙල්ගේ මුල් දිශානුගත අර්ථකථනය සමඟ සෘජුවම සමපාත වේ. තවද පංකුලිය අශෝකාරාම පිළිමගෙයි ද්වාර මුරගල් දෙකෙහි ද නැගෙනහිර දිශාවට ඇත් රූපයත්, බටහිර දිශාවට ගව රූපයත් නිර්මාණය කර තිබීම මෙම දිශා සංකේතවාදයේ රටාව තවදුරටත් තහවුරු කරයි.

**මූලාශ්‍රයගත සංකල්පය සහ පුරාවිද්‍යාත්මක සාධක අතර සබඳතාව**

අනෝතත්ත විලේ සිව්මහා සතුන්ගේ මුඛවලින් ජලය පිටාර ගලා යන ආකාරය පිළිබඳ බෞද්ධ සාහිත්‍යමය විස්තරය, විජයාරාමයේ ආරාමික පරිශ්‍රයෙන් වැසි ජලය බැස යන ජල පිහිලි ආවරණ මත එම සතුන්ගේම රූප කැටයම් කිරීම තුළින් ව්‍යවහාරිකව වාස්තු විද්‍යාවට නගා ඇති ආකාරය මින් පැහැදිලි වේ. ආශ්‍රම සංකීර්ණයක මධ්‍ය පූජනීය මළුව අනෝතත්ත විල ලෙසත්, එයින් සතර දිශාවට ජලය බැස යන පිහිලි පද්ධතිය සිව්මහා ගංගාවන් ලෙසත් සංකේතවත් කිරීමට පැරණි ශිල්පීන් උත්සාහ කර ඇති බව පෙනේ. මෙය බෞද්ධ සංකල්ප සහ උපයෝගීතා වාස්තු විද්‍යාව (Applied Architecture) අතර පැවති මනා සම්බන්ධතාවට කදිම නිදසුනකි.

**නිගමනය**

මෙම අධ්‍යයනයට අනුව නිගමනය කළ හැක්කේ බෞද්ධ සාහිත්‍යගත මූලාශ්‍රයවල විස්තර වන අනෝතත්ත විල පිළිබඳ විශ්වවිද්‍යාත්මක සංකල්පය මෙරට පැරණි වාස්තු විද්‍යාවේදී ජල කළමනාකරණ පද්ධති සැලසුම් කිරීම සඳහා සෘජුවම දායක කරගෙන ඇති බවයි. එච්. සී. පී. බෙල් විසින් මීට සියවසකට පෙර විජයාරාමයෙන් සොයාගත් ලෝකඩ සත්ත්ව රූප පදනම් කරගෙන ඉදිරිපත් කරන ලද දිශා සංකේතවාදී අර්ථකථනය, 2015 වර්ෂයෙන් පසුව සිදුකළ නව කැණීම්වලින් හමුවූ ජල පිහිලි ආවරණවල සත්ත්ව කැටයම් (නැගෙනහිරින් ඇතා, දකුණෙන් අශ්වයා, බටහිරින් ගවයා) මගින් ශාස්ත්‍රීයව හා භෞතිකව තහවුරු වේ. මෙම නව දත්තයන් ශ්‍රී ලංකාවේ පැරණි කලා ඉතිහාසය සහ වාස්තු විද්‍යාව පිළිබඳ නව මාන ඔස්සේ ඉදිරි පර්යේෂණ මෙහෙයවීම සඳහා අතිශයින්ම වැදගත් ශාස්ත්‍රීය දායකත්වයක් සපයයි.

**ප්‍රමුඛ පද** - අනෝතත්ත විල, ජල පිහිලි ආවරණ, දිශා සංකේතවාදය, විජයාරාමය, සත්ත්ව රූප

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය 3* (සත්තක සහ අට්ඨක නිපාත). (1976). ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ප්‍රකාශන කාර්යාංශය. (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, සූත්‍ර පිටකය, සත්තසූරියුග්ගමන සූත්‍රය).

*පරමත්ථජෝතිකා නම් සුත්තනිපාතට්ඨකථා* (පළමු කොටස). (1995). බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව. (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව - 40, අනෝතත්ත විල සහ සතර දිශා වර්ණනාව).

සෙනෙවිරත්න, අනුරාධ. (1995). *රංගිරි දඹුලු රජමහ විහාරය*. කොළඹ.

Anandacoomaraswamy, A. (1962). *Medieval Sinhalese Art* (Trans. H. M. Somaratne). Colombo.

*Archaeological Survey of Ceylon*. (1891, 1892, 1893). Annual Reports. Colombo.

Paranavitana, S. (1954). *The significance of Sinhalese. Moonstone*.. Artibus Asiae, 17(3/4), 197–231.

Paranavitana, S. (1967). *The Moonstone and Other Ceylon Antiquities*. Colombo.

University of Ceylon. (1964). *History of Ceylon* (Vol. 1). Vidyalankara University.